# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | MF/06/23/50/2023 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.03. 20 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, කොමිෂන් සභා සභාපතිවරු,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව සියළුම රාජ්‍ය බැංකු ප්‍රධානීන්,
විශ්ව විද්‍යාල උපකුලපතිවරු , උසස් අධ්‍යාපන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සමාගම්වල සභාපතිවරුන්

<u>රාජකාරි විදේශ ගමන් සදහා විනිමය මුදාහැරීම හා ඒ ආශ්‍රිත වියදම්</u>

වර්තමානයේ රටේ පවත්නා ආර්ථික හා මූල්‍ය දුෂ්කරතා මත රජයේ අරමුදල් අත්‍යවශ්‍ය කාර්යයන් සදහා පමණක් ඉතා අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතු බැවින්, නිල දූත කාර්යයන් හා රාජකාරි, සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළුව සියළුම රාජකාරි කටයුතු සදහා විදේශගත වීමේදී ගෙවනු ලබන දීමනා සීමා කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව 2023 මාර්තු මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මු.අ.01/2015/01 චක්‍ර ලේඛයෙහි සදහන් මතු දැක්වෙන විධි විධාන පහත සදහන් පරිදි සංශෝධනය කිරීමට ගරු ජනාධිපතිතුමා විසින් නියම කර ඇති බව කාරුණිකව දන්වමි.

I. 03 ඡේදය - අනියම් දීමනා ගෙවීම

- 03 (අ) උප ඡේදයෙහි සදහන් අනියම් වියදම් පියවා ගැනීම සදහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 15 ක් දක්වා අනියම් දීමනා ගෙවිය යුතුය.

- 03(ආ) උප ඡේදයෙහි සදහන් අනියම් වියදම් පියවා ගැනීම සදහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 40 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනා ගෙවිය යුතුය.

II. 04 ඡේදය - සංයුක්ත දීමනා ගෙවීම

- 04(අ) උප ඡේදයෙහි දැක්වෙන වගුවෙහි දෙවන හා තුන්වන තීරුවල සදහන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් ගෙවනු ලබන දීමනා 30% කින් අඩු කර ගෙවිය යුතුය.

- 04(ඉ) උප ඡේදයෙහි සදහන් ශිෂ්‍යත්වයක් සදහා විදේශ රජයන් හෝ ප්‍රදායක ආයතනයන් විසින් අනියම් දීමනා නොගෙවන අවස්ථාවලදී, විදේශගත වන නිලධාරියෙකුට අනියම් වියදම් පියවා ගැනීම සදහා එක් දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 25 ක් බැගින් උපරිම දින 10 ක් දක්වා අනියම් දීමනා ගෙවිය යුතුය.

III. 05 ඡේදය - සංග්‍රහ දීමනා ගෙවීම

නිල චාරිකාවකදී දූත පිරිසට නායකත්වය දෙන අමාත්‍යවරයා හෝ අමාත්‍යාංශ ලේකම්වරයාට එම චාරිකාවේදී සංග්‍රහ වියදම් දැරීමට සිදු වන්නේ නම්, අදාල රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක මුදල් ප්‍රතිපාදන ලබා දිය හැකි අතර, අදාළ රටෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් නොමැති නම්, ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරනු ලබන නිල දූත පිරිසෙහි නායකත්වය දරන අමාත්‍යවරයාට හෝ ලේකම්වරයාට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 750 ක් සඳහා වූ මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවිය හැක.

03. තවද, ප්‍රදායක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරනු නොලබන විදේශ අධ්‍යයන/පුහුණු/සාකච්ඡා/ සම්මන්ත්‍රණ/ සංචාර සඳහා දේශීය අරමුදල් මගින් වියදම් දරමින් රජයේ නිලධාරීන් සහභාගි නොකළ යුතුය.

04. ඉහත 02 හා 03 ඡේදයන්හි සඳහන් විධි විධානවලට අදාළව මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ හෝ උපදෙස් ලිපි වල සඳහන් විධි විධාන 2023 මාර්තු මස 20 වැනි දින සිට බලරහිත වන බව කාරුණිකව දන්වා සිටිමි.

කේ.එම්.මහින්ද සිරිවර්ධන
ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පිටපත: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති